අ.පො.ස උසස් පෙළ

# පෙරදිග සංගීතය



## ආලාප සහ ආලාප වර්ග

## ආලාප සහ ආලාප වර්ග

රාගයක භාවමය ස්වරූපය නිරූපණය වන අයුරින් රාගයේ රස භාවයන් ඉදිරිපත් කරමින් රාගය විස්තර කිරීම ආලාපයෙන් කරනු ලබයි. ඒ සඳහා ශිල්පියාගේ රාග ඥානය, ස්වර ඥානය පිළිබඳ සුවිශේෂ දැනුම ඉවහල් වේ. ආලාප ගායනය තාලයෙන් තොරව ලිහිල් වූ රිද්මයකට කරනු ලබයි.

රාගයේ රසය හා ස්වරූපය ශ්‍රාවකයාට වටහාදීමටත්, ගායකයාට රාගය තුළ රැඳෙමින් තම භාවමය හැකියාවන් තුළින් උසස් රසයක් ලබාදීමට ද ආලාපය ඉවහල් වේ.

ආලාප ගායනය ස්වර, අකාර් ආධාරයෙන් සහ "නෝම්,තෝම්" ආධාරයෙන් යන දෙයාකාරයකින් ගායනය කරනු ලබයි.

ආලාප ගායනය ප්‍රධාන කොටස් හතරකි. එනම්,

1. ස්ථායි ආලාප
2. අන්තරා ආලාප
3. සංචාරී ආලාප
4. අභෝග ආලාප

### ස්ථායි ආලාප

ආලාප ආරම්භ කරනුයේ ස්ථායි ආලාපයෙනි. රාගයේ ග්‍රහ ස්වරයෙන් ආලාපය ආරම්භ කර පූර්වාංගයෙහි හැසිරීම ස්ථායි ආලාපයෙන් සිදුවේ. වාදී, සංවාදී ප්‍රබලතා දක්වමින් මන්ද්‍ර හා මධ්‍ය සප්තක ඇසුරු කරමින් ආලාපය ගායනය කරනු ලබයි.

### අන්තරා ආලාප

රාගයෙහි උත්තරාංග කොටසකට අයත් ස්වරයකින් අන්තරා ආලාපය ආරම්භ වේ. මධ්‍ය හා උච්ඡ සප්තක ඇසුරු කර ගන්නා අතර මධ්‍ය සප්තකයේ සිට උච්ඡ සප්තකය දක්වා ස්වර විහිදුවන අතර උච්ඡ සප්තකයෙහි වැඩි වශයෙන් හැසිරේ.

# පෙරදිග සංගීතය

## සංචාරී ආලාප

සංචාරී ආලාපයේදී මන්ද්‍ර, මධ්‍ය හා තාර යන ත්‍රිවිධ සප්තකයෙහිම හැසිරීම සිදුවේ. ද්‍රැත ලය ආශ්‍රයෙන් ගායනා කරනු ලබයි. සප්තක තුනෙහිම රාගයට අයත් සංගතීන්ගේ භාවිතය හා අලංකාරය සංචාරී ආලාප වලදී දැකිය හැකිය.

## ආභෝග ආලාප

ආභෝග ආලාපය බෙහෙවින් තාර (උච්ඡ) සප්තකය ඇසුරු කරයි. උච්ඡ " ස " ස්වරය මුල් කොට ගෙන හැසිරේ. අති ධෘත රිද්ම රටාවක් භාවිතා කරමින් ගයනු ලබයි. ස්ථායි, අන්තරා, සංචාරී ආලාප සම්මිශ්‍රණයෙන් රාග භාවය විචිත්‍ර ලෙස ඉදිරිපත් කිරීම මෙමඟින් සිදුවේ.